CPA

Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පනත් කෙටුම්පතට ආණ්ඩුව විසින් ඉදිරිපත් කර ඇති විසිදෙවැනි ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි ප්‍රකාශය

2022 ජූනි 30: ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යෝජිත විසිදෙවන ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත (පනත් කෙටුම්පත) වර්ෂ 2022 ජූනි 24 දිනැති ගැසට් නිවේදනයේ II කොටස, වර්ෂ 2022.06.29 දින නිකුත් කරන ලද අතිරේකය ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (Centre for Policy Alternatives-CPA) විසින් ස්වකීය සැලකිල්ල දක්වනු ලබයි. මේ අන්දමින් විසිදෙවන සංශෝධනය පනත් කෙටුම්පතක් වශයෙන් ගැසට් කර ඇති මෙම පනත් කෙටුම්පත බලාත්මක වුවහොත් එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිඑක්වන සංශෝධනය බවට පත්වනු ඇත. මෙම සංශෝධන පනත් කෙටුම්පත යනු අප රටේ පාලන ක්‍රමය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් සහ ජාත්‍යන්තර හවුල්කරුවන් යන දෙඅංශයෙන්ම තුළින්ම විද්‍යමාන වී ඇති පෙර නොවූ විරූ අන්දමේ මහජන විරෝධතා සහ විශ්වාසය බිඳ වැටීම සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් ඉදිරිපත් කර ඇති ආයතනික ප්‍රතිසංස්කරණ සිදු කිරීම හා බැඳි ප්‍රතිචාරයයි.

මෙම පනත් කෙටුම්පත මගින්, ජනාධිපතිවරයාගේ බලතල කප්පාදු කිරීමක් හෝ කිසිදු අර්ථාන්විත ආකාරයකින් සංවරණ හා තුලන තත්ත්වයක් හඳුන්වා නොදෙන බව මෙන්ම එය ශ්‍රී ලංකාවේ ජනතාවගේ ඉල්ලීම්වලට පටහැනි බව ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මෙහිදී සඳහන් කර සිටී. රාජ්‍ය පාලනයේ නෛසර්ගික ගැටලු විසඳීමට කිසිදු අව්‍යාජ උත්සාහයක් නොමැති සන්දර්භයක් තුළ, මේ අන්දමින් හඳුන්වාදීමට උත්සහ කරනු ලබන මෙම ප්‍රතිසංස්කරණ හරහා පවතින දේශපාලන හා ආර්ථික අර්බුදකාරී තත්ත්වය තවදුරටත් නරක අතට හැරෙනු ඇති අතර ආණ්ඩුක්‍රම වයවස්ථාමය පාලනය කෙරෙහි පුරවැසියන්ට ඉතිරිව ඇති අල්පමාත්‍ර වූ විශ්වාසය ද එමගින් විනාශ වනු ඇත.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මෙකී පනත් කෙටුම්පතේ අන්තර්ගතය ඉතා මැනවින් සලකා බලා ඇති අතර ඒ අනුව, මෙම පනත් කෙටුම්පත හරහා දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය (වර්ෂ 2015-19) යටතේ පැවති ආණ්ඩුක්‍රම ව්‍යූහය වෙත මෙකී යෝජිත තත්ත්වයන් මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රතිවර්තනය නොකරන බව සටහන් කරනු ලබයි. අධිකරණ අමාත්‍යවරයා විසින් මෙම පනත් කෙටුම්පතේ මීට පෙර අනුවාද දෙකක් (එකක් පුද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් ලෙස) යෝජනා කර තිබුණි.ගැසට් කරන ලද වර්තමාන පනත් කෙටුම්පත මඟින් අධිකරණ අමාත්‍යවරයා විසින් මීට පෙර ඉදිරිපත් කළ සීමිත යෝජනාවන්හි ද සැලකිය යුතු දුර්වල වීමක් පිළිබිඹු කරනු ලබනන්නා සේම එමගින් කිසිදු සංවරණ හා තුලන තත්ත්වයකට භාජනය නොවන විධායක ජනාධිපතිවරයාගේ බලතල එලෙසම පැවතීමට ඉඩ ප්‍රස්ථාව දී තිබීමද දැකිය හැකි වේ.

උදාහරණයක් වශයෙන්, යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ (සභාවේ) සංයුතිය දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පැවති තත්ත්වයට සාපේක්ෂව සැලකිය යුතු අන්දමින් දියාරු තත්ත්වයකට පත්වී ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ යෝජිත සංයුතිය ආණ්ඩුවට හිතකර වන අතර එහි සාමාජිකයින් 10 දෙනාගෙන් 7 දෙනෙකු පාලනය කිරීමට හෝ ඔවුන්ට බලපෑම් කිරීමට ආණ්ඩුවට හැකියාව ලැබේ. මේ අනුව බලන කල, මෙකී යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව හුදෙක් විසිවන සංශෝධනය යටතේ පවතින පාර්ලිමේන්තු සභාවේ දිගුවක් පමණක් බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි අදහස වේ. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පිහිටුවීමේ මූලික අභිප්‍රාය වූයේ රාජ්‍ය පාලනය දේශපාලනීකරණයෙන් වියුක්ත කිරීම වන අතර ඒ සඳහා ක්‍රම ද්විත්වයක් ඇතුළත් විය: ඉන් එකක් වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ බහුතර නියෝජනයක් දේශපාලඥයින් නොවන තැනැත්තන් සඳහා සහතික කිරීම වන අතර අනෙක් කරුණ වූයේ දේශපාලනික පසුබිමකින් ඇතුළත් වන සාමාජිකයන් කෙරේ ඇති ආණ්ඩුවේ ආධිපත්‍යය ඉවත් කිරීමයි. එසේ වුවද, වර්තමාන පනත් කෙටුම්පතේ යෝජනා කර ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සංයුතිය එම අරමුණු කිසිවක් සාක්ෂාත් කර නොගන්නා අතර ඒ වෙනුවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව හරහා පත්වීම් ලබා දෙන ආයතනවල ස්වාධීනත්වය ද අවතක්සේරුවට ලක් කරනු ලබයි.

අමාත්‍ය මණ්ඩලය පත් කිරීම සහ ඉවත් කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයාගේ බලතල යම් මට්ටමකින් කප්පාදු කිරීමට කිසියම් උත්සාහයක් ගෙන ඇති වුවද, ඒවා ඊළඟ පාර්ලිමේන්තුවේ සිට පමණක් අදාළ වන බවට පෙන්වාදෙනු ලබන අන්තර්කාලීන විධිවිධාන මගින් මේ සියල්ල අර්ථශූන්‍ය තත්ත්වයට පත් වී ඇත. තවද, ජනාධිපතිවරයාට තම අභිමතය පරිදි සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් පත් කිරීමට හැකියාව ලැබේ. මෙමගින් නැවතත් ජනාධිපති නිලයට සංකේන්ද්‍රණය වී ඇති විධායක බලය එපරිද්දෙන්ම ආරක්ෂා වීමක් සිදු වේ.

වත්මන් ආර්ථික අර්බුදය යනු බලයට පත් වූ ආණ්ඩුවල අඥාන ක්‍රියා සහ නොකරහැරීම් වල ඓතිහාසික ප්‍රතිඵලයකි. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා වැඩි බලයක් තමන් වෙත සංකේන්ද්‍රණය කර ගනිමින්, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන හරහා එතරම් ශක්තිමත් භාවයකින් තොරව වුවද ක්‍රියාත්මක වූ සංවරණ හා තුලන සහ බලතල බෙදීම් පවා ඉතාම හානිදායක අන්දමට අවතක්සේරුවට ලක් කළ වත්මන් ජනාධිපති ධූරය දරන පුද්ගලයාගේ ක්‍රියාකලාපය ඔස්සේ මෙම අර්බුදකාරී තත්ත්වයන් තවත් තීව්‍ර විය. වර්ෂ 2019 දී වත්මන් ජනාධිපතිවරයාගේ පත්වීම සිදු වූ මැතිවරණයෙන් පසු වාර්තාගත අන්දමින් පෙන්නුම් කරන ලද අදක්ෂකම, නොසැලකිලිමත්කම සහ දූෂණය වූ කලී අප රටට වර්තමානයේ මුහුණ දීමට සිදුව ඇති පෙර නොවූ විරූ අන්දමේ ආර්ථික ව්‍යසනයට ඍජු බලපෑමක් හා හේතු පාදක වීමක් වී ඇත. මෙකී ව්‍යසනකාරී තත්ත්වය හුදෙක් විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හේතුවෙන් පමණක් නොව සමස්තයක් වශයෙන් විධියක ජනාධිපති ක්‍රමය මගින් ආයතනික වශයෙන් උද්ගත කර ඇති තත්ත්වයක් වන්නා සේම එමගින් අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ක්‍රමවේදයේ කේන්ද්‍රයෙහි වගවීමේ වටිනාකමට නිසි වැදගත්කමක් දී නොමැතිකම සංකේතවත් කරමින්, අඛණ්ඩවම ප්‍රජාතන්ත්‍රවාදයෙහි හර පද්ධතිය යටපත් කිරීම ද විද්‍යමාන කරනු ලබයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ හරහා මේ අන්දමට පවතින පෙර නොවූ විරූ ව්‍යසනයට වඩාත් යෝග්‍ය ආයතනික මට්ටමේ ප්‍රතිසංස්කරණමය ප්‍රතිචාරය වන්නේ විධායක ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන් අහෝසි කර පූර්ණ පාර්ලිමේන්තු ව්‍යවස්ථාපිත ප්‍රජාතන්ත්‍රවාදයකට නැවත ප්‍රවේශ වීමයි. ආරම්භයේ සිටම, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළ යුතු බවට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දැඩි ස්ථාවරයක් දැරූ අතර, විධායක ජනාධිපති නිලයේ බලතල ඉහළ නැංවීමට ගන්නා උත්සාහයන්ට නිරන්තරයෙන්ම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ස්වකීය විරුද්ධත්වය පෙන්නුම් කරන ලදී. විධායක ජනාධිපති ක්‍රමයේ අසීමිත සහ සංවරණ හා තුලන තත්ත්වයකට පාත්‍ර නොකළ බලතල අහෝසි කර පාර්ලිමේන්තුව නියෝජනය කරන සහ ඊට වගකියන කැබිනට් විධායක ක්‍රමයක් ආදේශ කරන්නේ නම් මිස; වත්මන් ආර්ථික අර්බුදය විසඳීමට අවශ්‍ය තීරණ ගැනීමට නොහැකි වනු ඇත.


Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka
Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org

වත්මන් ආර්ථික තත්ත්වය තවදුරටත් බිඳ වැටීම වැලැක්වීම සඳහා කෙටි කාලීනව සිදු කළ යුතු දුෂ්කර විකල්ප අවස්ථාවන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී ආණ්ඩුව විසින් තීරණ ගැනීම විනිවිදභාවයෙන්, වගවීමෙන් සහ වෙනස් වූ විවිධ මතවලට ඉඩ සැලසිය යුතු අන්දමින් සිදු විය යුතු බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මෙහිදී විශේෂයෙන් සඳහන් කරනු ලබයි. ආර්ථිකමය වශයෙන් දක්වන ප්‍රතිචාරයේ තාක්ෂණික නිපුණතාවය ඉතා වැදගත් වන අතරම ආර්ථික බිඳවැටීමෙන් අසමාන ලෙස පීඩාවට පත් වූ ශ්‍රී ලාංකේය සමාජයේ වඩාත්ම අවදානමට ලක්විය හැකි ආන්තික ජන කොටස්වල අවශ්‍යතා සහ දුක්ඛිත තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීම යන ද්විත්වය කෙරෙහිම අවධානය දැක්වීමේ වැදගත්කම සහතික කිරීම සඳහා මතවාදයන්හි විවිධත්වය තීරණාත්මක වශයෙන් වැදගත් වේ. මෑත කාලීනව ඉතා පැහැදිලිව පෙන්නුම් කළ පරිදි අත්තනෝමතික සහ ඉක්මන් තීරණ ගැනීම ඔස්සේ ප්‍රමාණවත් ප්‍රතිපත්තිමය පිළිබිඹුවක් සහ සුජාතභාවයක් පෙන්නුම් නොකෙරෙන අතර, එමගින් සමාජ අතෘප්තිය උග්‍ර කිරීමට හේතු විය හැකි අතර වත්මන් ආණ්ඩුවේ ප්‍රධාන ප්‍රතිපත්තිමය තීරණ බොහොමයක් මෙන් නැවත නැවතත් ආපසු හැරවීම් වලට ලක් විය හැකිය. ආර්ථික සංවර්ධනය සඳහා ඒකපාර්ශ්වික සහ මධ්‍යගත විධායක තීරණ ගැනීම සඳහා වර්ෂ 2020 දී විසිවන වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒම සඳහා භාවිතා කරන ලද වාගලංකාරයන් වර්තමාන අර්බුදයට හේතු පාදක වශයෙන් ඍජුවම සම්බන්ධ වන බවත් එවැනි ආකෘතියක් නිසැකවම ප්‍රතික්ෂේප කළ යුතු බවත් සඳහන් කළ යුතුය. වර්තමානයේ ශ්‍රී ලංකාව මුහුණ දෙන බහුවිධ අභියෝග සලකා බලන විට, ශ්‍රී ලංකාවේ ආර්ථිකය නැවත ප්‍රකෘති තත්ත්වයට නගාසිටුවීම කිසිසේත්ම විධායක තීරණ ගැනීමේ පාලන ආකෘතියක් මත යලිත් පදනම් විය නොහැක.

මෙකී හේතුන් නිසා, ශ්‍රී ලංකාවේ ආර්ථිකය ප්‍රකෘති තත්ත්වයට පත් කර වීමේ ක්‍රියාවලියෙහි කොටසක් විය යුතු අත්‍යවශ්‍ය ආයතනික ප්‍රතිසංස්කරණ සඳහා මෙම පනත් කෙටුම්පත කිසිදු අර්ථයකින් සාධනීය දායකත්වයක් නොවන බව ව්‍යවස්ථාමය මූලධර්මය සහ ව්‍යවස්ථාමය ආකෘතීන් යන ද්විත්වයෙහිම දෘෂ්ටිකෝණයන්ගෙන් මනාව පැහැදිලි වේ.

එය හුදෙක් වෙනසකට ඇති ආණ්ඩුවේ අභිප්‍රාය පෙන්වීමට වෙර දැරීමේ නිෂ්ඵල උත්සාහයක් වන්නා සේම මෙකී සංඛේතාත්මක ප්‍රතිසංස්කරණ වලට ශ්‍රී ලංකාව හෝ එහි ජනතාව කෙරෙහි සැලකිය යුතු ධනාත්මක සාධනීය බලපෑමක් ඇති කිරීමට හැකියාවක් නැත. වර්තමාන අර්බුදයට පිළියම් යෙදිය හැකි සහ අනාගතයේදී එය නැවත සිදු නොවන බවට සහතික විය හැකි පුළුල් වූ විධිමත් ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ. ඒ සඳහා මෙම පනත් කෙටුම්පත ප්‍රතික්ෂේප කළ යුතුය.

Centre for Policy Alternatives
Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka
Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org